ළහිරු කරුණානායක



# ඔබ ඈත සඳ වී

## - බණ්ඩාර අතාවුද

**1) ඔබ සංගීත ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වන්නේ කොයි ආකාරයටද?**

මම ශාස්ත්‍රීය ගායකයකු හා ශාස්ත්‍රීය වාදකයකු වශයෙන් ක්ෂේත්‍රයට එන්නේ 1969 වර්ෂයේ. ඊට පස්සේ පරීක්ෂණවලින් සමත් වෙලා 1976 විතර ඉඳලා සරල ගී වැඩසටහන්වලට සම්බන්ධ වුණා. එතකොට අවුරුදු තිස් ගණනක ඉඳලා මේ ක්ෂේත්‍රයේ ඉන්නවා.

**2) සංගීතය පිළිබඳ ඔබගේ හැදෑරීම කොයි වගේද?**

මම රජයේ සංගීත විද්‍යාලයේ සංගීතය හැදෑරුවේ. දැන් සෞන්දර්යය විශ්වවිද්‍යාලය කියලයි හඳුන්වන්නේ. එහි අවුරුදු 5 ක් අධ්‍යාපනය ලබන්න ඕන විෂයයන් දෙකකින්. එකක් වාදනය. අනික් එක ගායනය. වාදනය සඳහා මම වයලීනය තෝරා ගත්තේ. 1960 වර්ෂයේ අතුළුවෙලා 1971 වර්ෂයේදී තමයි මම එහි අධ්‍යාපන කටයුතු අවසන් කරන්නේ.
ඒ අතරේදී ඒ කාලේ මාස 3 ක් රජයේ සංගීත විද්‍යාලයේ නිවාඩු තියෙනවා. ඒ දවස් වල දී මම ඉන්දියාවේ භාත්කණ්ඩේ ගිහින් සංගීත ඩිප්ලෝමාව, විශාරද උපාදිය සමත් වුණා.

**3) ඔබ මුලින්ම ඔබගේ ගීතයක් ලෙස ගායනය කළ ගීතය පිළිබඳ සඳහන් කළොත්**

ඒ දවස්වල 'නව පද මාලා' කියලා වැඩසටහනක් තිබුණා ගුවන්විදුලියේ. එහි තමයි මට මුලින්ම ගීතයක් ගායනා කරන්න අවස්ථාවක් ලැබුණේ. රත්න ශ්‍රී විජේසිංහ ලියපු 'නෙතු පියන් පියා' ගීතය නව පදමාල වැඩසටහනේ මම ගායනා කළා

**4) සංගීත අධ්‍යාපනය අවසන් කළ පසු වෘත්තීය ජීවිතය හා නිර්මාණකරණය දිගහැරුණෙ කොහොමද?**

රජයේ සංගීත විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීමෙන් පස්සේ මම ගුරු වෘත්තීයට ප්‍රවිෂ්ට වෙනවා. ඒ 1972 අවුරුද්දේ. අවුරුදු 14 ක් ම මම ලංකාවේ විවිධ පළාත්වල පාසල්වල සංගීත ගුරුවරයකු ලෙස කටයුතු කළා. 1985 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ආරම්භ කරන විට, පොල්ගොල්ල මහවැලි අධ්‍යාපන විද්‍යාපීඨයේ සංගීතය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයා ලෙස මම විශ්‍රාම යන තෙක්ම සේවය කළා. ඒ අතරතුර තමයි මගේ ගීත නිර්මාණ කටයුතු වල යෙදුනේ.

**5) ඔබගේ නිර්මාණ ජීවිතය ගලාගිය ආකාරය පිළිබඳ සඳහන් කළොත්**

මම ගීත වැඩි සංඛ්‍යාවක් ගායනා කරලා නෑ. මං හිතන්නේ ගීත 60 ක් වගේ ප්‍රමාණයක් තමයි තියෙන්නේ. මම ජීවිතයේ වැඩි වශයෙන් ගත කළේ මහනුවර නිසා කොළඹත් සමග ඇති සම්බන්ධතාව දුරස් වුණා. ඒ නිසා තමයි මට වැඩි වශයෙන් නිර්මාණවලට සම්බන්ධ වන්න බැරි වුණේ. කෙසේ වෙතත් ගායනා කරපු ගීත වලට, රසිකයෝ ඉතා ප්‍රිය කළා. ඇත්තටම මම මේ ගීත ගායනා කළේ මගේ රාජකාරී මාධ්‍යයේ. වැඩි ගීත ප්‍රමාණයක් නොගැයුවත් මම ගායනා කළ ගීත හා ඒවා සමාජය වැළඳගැනීම පිළිබඳ මම ඉතාමත් සතුටු වෙනවා.
 ගායකයෙක් වශයෙන් ඉදිරියට එන්න මම ඉතාම මහන්සි වුණා. නුවර පළාතෙ වීම එක හේතුවක් කොළඹට දුරස් වීමට. ඒ වගේ දුෂ්කරතා මැද්දේ මම දායක වුණු නිර්මාණ රසිකයන් අතරට යාම පිළිබඳ මම සතුටු වනවා.

**6) ඔබ ඉතා සුළු ගීත ප්‍රමාණයක් ගායනා කළත් ඒ හැම ගීතයක් ම පාහේ අදටත් රසිකයන් අතර තියෙනවා**

මම හැම වෙලාවෙම කියන්නේ ගායකයෙක් වෙන්න පදනමක් තියෙන්න ඕන. සංගීත විෂය පිළිබඳ හොඳ දැනුමක් තිබුණොත් තමන්ගේ නිර්මාණ පැවතෙනවා කියන එක මම විශ්වාස කරනවා. මම ඉගෙන ගත්ත ශාස්ත්‍රීය දේවල් වල ගති ලක්ෂණ මම ගායනා කරපු ගීත වලට ඇතුළත් කළා. මේ පදනම ඔබ සඳහන් කළ කාරණයට හේතුවක් වන්නට ඇති.

**7) අද ඇතැමුන් නගන මැසිවිල්ලක් තමයි සුභාවිත ගීතය යටපත් වෙලා කියන එක. ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙක් ලෙස ඔබ එය දකින්නේ කොහොමද?**

මමත් ඒක පිළිගන්නවා. අද විවිධ නාලිකාවලින් දැන් ඉන්න රසිකයන්ට සුභාවිත ගීත ශ්‍රවණය කිරීමට ලබාදෙන ඉඩ හසර අඩුයි. මේවා ප්‍රචාරය කළ යුතුයි. එහෙම වුණොත් විතරයි නව පරපුර මේවාට යොමු වන්නේ. දැන් ඇහෙන ගීතවල වචන ගත්තොත් ඒවා සිංහල සාහිත්‍යයෙන් පෝෂණය වෙලා නැති හරසුන් ඒවා බව පේන්න තියෙනවා. ඇතැම් ගීතවලට කතන්දර කියනවා වගේ බොහොම ළාබාල වචන තමයි යොදලා තියෙන්නේ.

**8) නූතනයේ අපි දකින තවත් ප්‍රවණතාවක් තමයි ගීත සඳහා 'රූප රචනය' කිරීම. මෙය ගීතයේ ගුණාත්මක වර්ධනයට හේතු වෙයිද?**

ඇත්තටම අපි එක එක්කෙනාගේ රසය බොහොම වෙනස්. අපි විවිධ ආකාරවලින් තමයි රස වින්දනය කරන්නේ. එතකොට රූප රචනය කරන්නේ එක්කෙනෙකුගේ හෝ දෙදෙනෙකුගේ අදහස්වලට අනුව. එතන පොදු බවක් නෑ. අපි ගීත ඇහුවේ රූප රචනයක් නතිව. අපි සිතින් රස වින්දා. මගෙ අදහස නම් වඩා නිවැරදිව රස විඳින්න පුළුවන් වෙන්නේ රූප රචනයක් නැතිව කියන එක. අද දකින රූප රචනාත් එකම ශෛලියේ ඒවා. ගීතයක් රස විඳින්න ඕන කන් දෙකෙන් අහලා. රූප රචනය බලලා නොවෙයි.

**9) සුභාවිත ගීතය සඳහා ඇති අවකාශය පුළුල් කරගැනීම සඳහා සිදුවිය යුත්තේ කවර ආකාරයේ දෙයක්ද?**

අද ඕනෑම කෙනෙකුට ගීතයක් එළි දක්වන්න පුළුවන්. දැන් තියෙන තත්ත්වය දකිද්දී මට හිතෙනවා ගීත නිර්මාණය සඳහා යම් ප්‍රමිතිකරණයක් තිබුණොත් හොඳයි කියලා. ඒ වගේම සුභාවිත ගීත නිතර නිතර ප්‍රචාරණය වුණොත් ඒක තමයි වඩා වැදගත් වෙන්නේ. එතකොට රසිකයන්ට යහපත් නිර්මාණ තෝරා බේරාගෙන රසවිඳින්න පුළුවන්. යම් ප්‍රමිතියක් ගොඩ නඟනවා නම් ගීතයේ තනුව, පද මාලාව, නාද සංයෝජනය හා ගායනය වගේ අංශ ගැන අවධානය යොමු කරන්න ඕන.

**10) ඔබ නුදුරේ සහභාගී වීමට නියමිත ඕස්ට්‍රේලියාවේ 'සොඳුරු සෙවණැලි' ප්‍රාසාංගික අත්දැකීම ගැන මොකද හිතන්නේ?**

මේ වැඩසටහනට මාත් සමග ප්‍රවීණ ගීත රචක රත්න ශ්‍රී විජේසිංහ හා නව පරපුරේ දක්ෂ සංගීතඥයකු වන නදීක ගුරුගේ සහභාගී වනවා. මෙය ඕස්ට්‍රේලියාවේ වෙසෙන සිංහල රසිකයන්ට ඉතා නැවුම් අත්දැකීමක් වේවි. ඇත්තටම මේ වගේ වැඩසටහන් වලින් විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන්ටත් සිංහල ගීත කෙරේ තියෙන රසාස්වාදනය වැඩි දියුණු කරගන්න අවස්ථාව ලැබෙනවා. මේ ගීත රසිකයන්ට සජීවීව අහන්න සැලසීම සුභාවිත ගීතය රැකගැනීමට ද හේතුවක් වන බව කියන්න පුළුවන්.

**බොහෝ කාලෙකට පස්සෙ තමයි මාත් මේ ඕස්ට්‍රේලියාවේ ප්‍රසංගයක් වෙනුවෙන් පැමිනෙන්නේ. මෙය ඔබට මෙන්ම මටත් සුවිශේෂී අත්දැකීමක් වේවි. මෙය කලාතුරකින් ඔබට විඳ ගැනීමට ලැබෙන සංගීතමය අත්දැකීමක්. ඒ නිසා මම ඔබෙන් ඉල්ලා සිටිනවා මේ මහරු අවස්ථාව මග නොහැර, මාර්තු 20 වන ඉරිදා රිවර්ගම් තියටරයට පැමිණ අපත් සමග එකතු වන ලෙස.**

